# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,816 - 2013 ජුනි මස 21 වැනි සිකුරාදා - 2013.06.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 896 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 900 |


*සැ. යු.*- (i) ජයන්තිපුර සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(ii) පිය දසුන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(iii) ස්වාභිමානී දහම් සවිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූලි මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජුනි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

“1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත”

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින නුවරඑළිය හා රක්වාන සංචාරක බංගලා භාරකරු තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම

අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින නුවරඑළිය හා රක්වාන සංචාරක බංගලා භාරකරු තනතුරු 02ක් සඳහා බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අධ්‍යාපන සුදුසුකම් :* අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

02. *වෘත්තීය සුදුසුකම් :* තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) දෙවැනි හෝ තුන්වැනි මට්ටමට නොඅඩු මට්ටමක සංචාරක බංගලා භාරකරු තනතුරට අදාළ අමුත්තන් පිළිගැනීම, ආහාර පිළියෙල කිරීම හා සංග්‍රහය, සංචාරක නිවාස අභ්‍යන්තර හා බාහිර අලංකරණ යටතේ පාඨමාලාවක් හදාරා තිබිය යුතු ය.

03. *පළපුරුද්ද :* සංචාරක බංගලා භාරකරු තනතුරට අදාළ ඉහත ක්ෂේත්‍ර යටතේ වසර දෙකක (2) පළපුරුද්දක් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතු ය. එම පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතු ය.

04. *කායික සුදුසුකම් :* සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

05. *වෙනත් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත සඳහන් (1 සිට 4 දක්වා) සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දින වනවිට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය. අදාල සහතිකවල පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

06. *වයස් සීමාව :* අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

07. *වැටුප් පරිමාණය :*
මාසිකව : රු. 12,210-10x130-10x145-10x160-12x170-රු. 18,600
(PL 2 - 2006(ඒ))

08. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය.*—වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

09. *රාජකාරි ස්වභාවය :*

1. පැමිණෙන අමුත්තන් පිළි ගැනීම හා අමුත්තන්ගේ ලේඛන තබා ගැනීම,
2. අමුත්තන්ට ආහාරපාන පිළියෙල කිරීම සහ සංග්‍රහ කිරීම,
3. සංචාරක නිවාසයේ ඇති මුළුතැන්ගෙයි උපකරණ ඇතුළුව සියලුම ගෘහ භාණ්ඩ පිළිබඳව හා උද්‍යානය පිළිබඳව භාරකාරත්වය දැරීම,
4. සංචාරක නිවාසය සහ ගෙවත්ත පිරිසිදුව නඩත්තු කිරීම,
5. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන්.

10. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

11. මෙම නිවේදනයේ පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කර ගත් අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කර, 2013.07.19 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ " අධිකරණ අමාත්‍යාංශයේ සංචාරක බංගලා භාරකරු තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් සිය අයදුම්පත් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු ය.

ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය,
උපරිමාධිකරණ සංකීර්ණය,
කොළඹ 12.

*වෘත්තීය පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙන ක්‍රමය :*

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම | 20 | |
| 2. උපකරණ සවි කිරීම, අලුත්වැඩියා කිරීම පිළිබඳ දැනුම | 20 | අදාළ නොවේ |
| 3. අදාළ ක්ෂේත්‍රයේ උපකරණවල දෝෂ හඳුනා ගැනීම පිළිබඳ දැනුම | 40 | |
| 4. ක්ෂේත්‍රයට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 20 | |
| එකතුව | 100 | |

13. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙන ක්‍රමය :

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| 02. අතිරේක පළපුරුද්ද | 60 | |
| 03. අතිරේක වෘත්තීය සුදුසුකම් | 20 | |
| 04. සම්මුඛ පරීක්ෂණයේ දී පිළිබිඹු කරන කුසලතා හා පෞරුෂය සඳහා | 05 | |
| එකතුව | 100 | |

සටහන : වෘත්තීය පරීක්ෂණයෙන් සමත් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. වෘත්තීය හා ව්‍යුහගත පරීක්ෂණ දෙකෙන්ම ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතුරෙන් කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

14. ඉල්ලුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, ඉල්ලුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපි තැපෑලේ දී නැතිවූ බවට කරන පැමිණිලි සලකා බලනු නොලැබේ.

15. යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වේ.

කමලිනී ද සිල්වා,
ලේකම්.

2013 මැයි මස 27 වැනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**අධිකරණ අමාත්‍යාංශය යටතේ පවතින නුවරඑළිය හා රක්වාන සංචාරක බංගලා භාරකරු තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම**

අංකය :————.
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. සම්පූර්ණ නම :- සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

02. මුලකුරු සමග නම :- සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

03. පුද්ගලික ලිපිනය :- සිංහලෙන්/දෙමළෙන් :————.
ඉංග්‍රීසියෙන් :————.

04. උපන් දිනය :————.

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :
අවු. :————. මාස :————. දින :————.

06. ජාතික හැඳුනුම්පත් අංකය :————.

07. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

08. විවාහක/අවිවාහක බව :————.

09. දුරකථන අංකය :————.

10. අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

අ. පො. ස. (උසස් පෙළ) විභාගය

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

11. වෘත්තිය සුදුසුකම් :————.
(අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පරිදි)

12. පළපුරුද්ද :————.
(අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් පරිදි)

13. වෙනත් සුදුසුකම් :————.

14. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කරනු ලබන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු වීමට යටත් වන බවත්, තෝරා පත්කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ..................... යන අය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ...........................තනතුරේ ස්ථිර/අනියම්/තාවකාලික, නිලධාරියෙකු/නිලධාරිණියක වශයෙන් සේවය කරන බවත් පෞද්ගලික ලිපිගොනුව අනුව ඔහු/ඇය විසින් ඉහතින් සඳහන් කර ඇති සියලු තොරතුරු නිවැරදි බවත් මෙම නිලධාරියාට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් ගෙන ඇති/නැති බවත් ඔහු/ඇය ඉහත කී තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදාහැරිය හැකිය/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව)

දිනය :————.

06-471

## ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

බඳවා ගැනීම්

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ දැනට පුරප්පාඩු වී පවත්නා තනතුරු පහක් බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *පොදු සුදුසුකම් :*

(i) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
(ii) උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
(iii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 40 ට නොවැඩි විය යුතු ය. (රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)
(iv) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

02. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

මෙම තනතුර ස්ථිර ය. පත්වීම ලැබූ දින සිට අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත්වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත වේ. රජය විසින් පනවනු ලැබ ඇති සහ වරින්වර පනවනු ලබන පොදු නීති, කොන්දේසි සහ නියමයන්ට යටත් ය. සේවා අවශ්‍යතාව මත විධිමත් ක්‍රමවේදයක් අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

03. *එක් එක් තනතුරට අදාළ තොරතුරු :*

3.1 තනතුරු නාමය : ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරි
3.1.1 වැටුප් පරිමාණය : AR 1-2006A රු. (24,725, 5 x 550 - 5 x 645 - 15 x 770 - රු. 42,250)
3.1.2 සුදුසුකම් :

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව යන විෂයය ක්ෂේත්‍රයකින් පළමු පන්තිය හෝ දෙවන පන්තිය (ඉහළ) සාමාර්ථයක් සහිතව සිව් අවුරුදු විශේෂ උපාධියක් ලබා තිබීම;

*හෝ*

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් දෙවන පන්තිය (පහළ) සාමාර්ථයක් සහිතව සිව් අවුරුදු සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව යන විෂයය ක්ෂේත්‍රයකින් විශේෂ උපාධිය ලබා තිබීම සහ එක් අවුරුදු පශ්චාත් අධ්‍යාපන ඩිප්ලෝමාව සමත් වී තිබීම;

*හෝ*

(iii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව හෝ ආර්ථික විද්‍යාව යන විෂයය ක්ෂේත්‍රයකින් උපාධියක් සහ දෑඅවුරුදු පර්යේෂණ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(ආ) (i) පර්යේෂණ සහ සමීක්ෂණ ඉටු කිරීම පිළිබඳව ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වනු ඇත. ක්ෂේත්‍රයට අදාළව ඉටුකර ඇති අධ්‍යාපන, පර්යේෂණ සහ සමීක්ෂණ සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ;

(ii) ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමට හැකිවීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

3.2 තනතුරු නාමය : වැඩසටහන් නිලධාරි (ප්‍රතිපත්ති/සැලසුම්)
3.2.1 වැටුප් පරිමාණය : MA 4-2006A - රු. (18,230- 10 x 365 - 15 x 450 - 5 x 550 - රු. 31,380)
3.2.2 සුදුසුකම් :

(අ) පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා තිබීම. (අධ්‍යාපන, කළමනාකරණ, තොරතුරු තාක්ෂණවේදය, පරිගණක විද්‍යා, ගණිතය, පුස්තකාල විද්‍යාව, සංඛ්‍යානය හා සමාජ විද්‍යාව යන විෂයය ක්ෂේත්‍රයන්ගෙන්)

(ආ) *අතිරේක සුදුසුකම් :*
(i) පර්යේෂණ හා සමීක්ෂණ කිරීම පිළිබඳ පළපුරුද්ද,
(ii) ව්‍යාපෘති හෝ වැඩසටහන්වල පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ පළපුරුද්ද,
(iii) ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමට ඇති හැකියාව.

3.3 තනතුරු නාමය : වැඩ සටහන් නිලධාරි (තොරතුරු)
3.3.1 වැටුප් පරිමාණය : MA 4-2006A - රු. (18,230 - 10 x 365 - 15 x 450 - 5 x 550 - රු. 31,380)
3.3.2 සුදුසුකම් :

(අ) පහත දැක්වෙන ක්ෂේත්‍ර යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලය, උපාධියක් ලබා තිබීම, (අධ්‍යාපන, කළමනාකරණ, තොරතුරු තාක්ෂණවේදය, පරිගණක විද්‍යා, ගණිතය, පුස්තකාල විද්‍යාව, සංඛ්‍යානය හා සමාජවිද්‍යාව යන විෂයය ක්ෂේත්‍රයන්ගෙන්)

(ආ) අතිරේක සුදුසුකම්;
(i) පර්යේෂණ හා සමීක්ෂණ කිරීම පිළිබඳ පළපුරුද්ද;
(ii) ව්‍යාපෘති හෝ වැඩසටහන්වල පරිඝණක මෘදුකාංග භාවිතය පිළිබඳ පළපුරුද්ද;
(iii) ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමට ඇති හැකියාව.

3.4 තනතුරු නාමය : පරිපාලන නිලධාරී
3.4.1 වැටුප් පරිමාණය : JM 1-1 2006A : රු. (20,525 - 10 x 365 - 18 x 550 -34,075)

3.4.2 සුදුසුකම්
(i) ක්‍රියාත්මක කිරීම්/උපදේශන සේවා ගණයේ වැඩසටහන් සහකාර (මුදල්) තනතුරෙහි අවම වශයෙන් වසර 06 ක සතුටුදායක සේවා කාලයක් තිබීම;

හෝ

(ii) කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයන්හි 1 වැනි ශ්‍රේණියේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම;

(iii) ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි පිළිබඳව උසස් දැනුමක් තිබීම අතිරේක සුදුසුකමකි.

3.5 තනතුරු නාමය : කළමනාකරණ සහකාර

3.5.1 වැටුප් පරිමාණය : MA1-1-2006A රු (13,450 - 10 x 145 - 7 x 170 - 4 x 240 - 20 x 320 - 23,450)

3.5.2 සුදුසුකම් :
(අ) (i) සිංහල හෝ දෙමළ භාෂාව
(ii) ගණිතය සහ
(iii) තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම;

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී විෂයයන් තුනක් (පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබීම,

(ඇ) පරිඝණක භාවිතය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් රජයේ හෝ කාර්මික හා තෘතියික අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් ආයතනයකින් ලබා තිබීම.

විශේෂිත සුදුසුකම් :

(i) ගණකාධිකරණය පිළිබඳව එක් අවුරුද්දකට නොඅඩු පාඨමාලාවක් රජය පිළිගත් ආයතනයකින් හදාරා තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ. (ගිණුම් අංශය සඳහා)

(ii) ශ්‍රී ලංකා පුස්ථකාල සංගමයේ ප්‍රථම පරීක්ෂණය හෝ ශ්‍රී ලංකාව තුළ පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යා සහතික පත්‍ර පරීක්ෂණය සමත්ව වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ. (පුස්තකාල හා තොරතුරු දත්ත බැංකුව සඳහා)

04. ඉල්ලුම් කළ යුතු ආකාරය :

දැනටමත් රාජ්‍ය/අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2013 ජූලි 19 වැනි දින වේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2013.07.19 දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, අංක 126, නාවල පාර, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙම දැන්වීමට අනුව ඇබෑර්තු පිරවීමට, නොපිරවීමට හෝ ඇබෑර්තුවලින් කොටසක් පමණක් පිරවීමට සම්පූර්ණ බලතල ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිට ඇත.

අපේක්ෂිත මූලික සුදුසුකම් සපුරා ඇති අය පමණක් අදාළ බඳවා ගැනීමේ ක්‍රමවේදය අනුව සලකා බැලේ.

මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක,
සභාපති.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව,
අංක 126,
නාවල පාර,
නුගේගොඩ.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ……… තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
1.2 මුලකුරු සමග නම :————.

02. ස්ථිර ලිපිනය :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. 4.1 උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.
4.2 අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස :
වර්ෂ :————. මාස :————. දින :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

06. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචියෙන් ද යන වග :—————.

07. අධ්‍යාපන සුදුසුකම් ඃ

7.1 පශ්චාත් උපාධියේ විස්තර (අදාළ වේ නම්) :—————.

7.2 උපාධියේ නම (අදාළ වේ නම්)
උපාධිය ලැබූ විශ්වවිද්‍යාලය :—————.
උපාධිය ලැබූ වර්ෂය හා මාධ්‍යය :—————.
උපාධි විෂයයන් :—————.
උපාධි බාහිර/අභ්‍යන්තර ද යන වග :—————.

7.3 අ.පො.ස. (උ.පෙ.) ප්‍රතිඵල ඃ

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

7.4 අ.පො.ස. (සා.පෙ) ප්‍රතිඵල ඃ

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

08. වෙනත් සුදුසුකම් :—————.

09. වෘත්තීය සුදුසුකම් :—————.

10. සේවා පළපුරුද්ද :—————.

11. මෙහි සඳහන් කර ඇති සියලු තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීම ඇතුලු දඬුවම්වලට යටත් වන බව මම දනිමි.

—————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

12. දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ

....................... මයා/මිය/මෙනෙවිය දැනට මෙම ආයතනයේ ................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි වන අතර ඉල්ලුම් කරන තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැත. මෙම අයදුම්පත නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

—————,
අත්සන හා නිල මුද්‍රාව

දිනය :—————.

06-564

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම්/දිසාපති කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013**

1. ඉහත තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව, කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම්/දිසාපති කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි තනතුරේ III වැනි ශ්‍රේණියේ හෝ පුහුණු ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරාගනු ඇත.

3. *වයස් සීමාව ඃ*

ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 30 නොවැඩි විය යුතු ය. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

4. (a) III ශ්‍රේණිය
*අධ්‍යාපන සුදුසුකම් ඃ*

(i) භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව විෂයන් 06 කින් අ.පො.ස. (සා. පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම,

*සහ*

(ii) ශුද්ධ ගණිතය/ව්‍යාවහාරික ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව අ.පො.ස. (උ. පෙළ) විෂයයන් 03 කින් එකවර සමත්වීම.

*වෘත්තීය සුදුසුකම් ඃ*

4aහි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් අයදුම්කරුවන් විසින් ලබා තිබිය යුතු ය. ඃ

(i) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාරේ හාඩි ආයතනය විසින් හෝ පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව; හෝ

(ii) ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව; හෝ

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව; හෝ

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කිරීම;

*හෝ*

(vi) ඉහත තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකම්.

(b) පුහුණු ශ්‍රේණිය
*අධ්‍යාපන සුදුසුකම් :*

ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂයයන් තුනකින් අ.පො.ස. (උ.පෙ.) විභාගය එකවර සමත්වීම සහ භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව විෂයයන් 06 කින් අ.පො.ස. (සා. පෙ.) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වීම.

*වෘත්තීය සුදුසුකම් :*

ඉහත සඳහන් මූලික අධ්‍යාපන සුදුසුකම් සහිතව රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක රැකියා ක්ෂේත්‍රයට අදාළ ජාතික තාක්ෂණ සහතිකය (තුන් අවුරුදු අර්ධ කාලීන පුහුණු පාඨමාලාව) ලබා තිබීම.

* විවෘත තරඟ විභාගයෙන් තාක්ෂණ සේවයේ පුහුණු ශ්‍රේණියකට සුදුසුකම් ලබන අයදුම්කරුවන්, සේවයට අදාළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත් වූ බවට අදාළ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කිරීමෙන් පසු III ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

* පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත්, ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයින්ගේ සේවය අත්හිටවනු ලැබේ.

5. *වැටුප් පරිමාණය :*

(a) III ශ්‍රේණිය
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 යටතේ MN3 - 2006A
රු. 15,005 - 180 x 4 - 240 x 6 - 320 x 11 - 360 x 20 - රු. 27,885

4 වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු අතර, පත්වීම ලැබ වසර 05 ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 පරිදි අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

(b) පුහුණු ශ්‍රේණිය
මාසික දීමනාව - රු. 12,920—

6. සේවා කොන්දේසි :

1. මෙම තනතුර ස්ථිර ය, විශ්‍රාම වැටුප් සහිත ය.

2. තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අභිමතය පරිදි දිස්ත්‍රික් ලේකම්/දිසාපති කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇත.

3. තෝරා ගන්නා අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යටත් වනු ඇත.

4. තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වන අතර, දැනටමත් රජයේ සේවකයෙක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ.

5. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග හා දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳි සිටී.

7.

(i) *බඳවා ගැනීමේ ක්‍රමය :*
මෙම විභාගය තාක්ෂණ සේවා මණ්ඩලයේ අධීක්ෂණය මත විභාග කොමසාරිස් ජනරාල් විසින් 2013 සැප්තැම්බර් මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

(ii) *විභාග ක්‍රමය :*

(*a*) විභාගය, සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(*b*) අපේක්ෂකයා විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

(*c*) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(iii) *විභාගයේ විෂයයන් :*

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

1. බුද්ධි පරීක්ෂණය

2. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය

*සටහන .-* බඳවා ගැනීමේ ශ්‍රේණිය වන III වැනි ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවේ නම්, ඉහත 4 (b) යටතේ සුදුසුකම් සපුරාලන විභාගය සමත් අයදුම්කරුවන් ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබේ.

8. *විෂය නිර්දේශය :*

1. **බුද්ධි පරීක්ෂණය :**
කාලය පැය 01 කි.
මුළු ලකුණු 100 යි

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

2. **තාක්ෂණ ප්‍රශ්න පත්‍රය :**
කාලය පැය 03 කි
මුළු ලකුණු 100 යි.

ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීමේ කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීම, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියා මාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු දැනුම විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ.

ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණවල එකතුව අනුව බඳවා ගැනීම සඳහා වූ ප්‍රමුඛතා ලේඛනය සකස් කෙරේ.

* ඉහත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා අවශ්‍ය වන ජ්‍යාමිතික උපකරණ හා සෙසු උපාංග අයදුම්කරු විසින් විභාග ශාලාවට රැගෙන ආ යුතුය.

9. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :*

ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කල හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10. *විභාග ගාස්තු :*

විභාග ගාස්තුව රු. 500 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 2003-02-13 ට බැරවෙන පරිදි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසා වත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර,මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

11. *අයදුම් කළයුතු ක්‍රමය :*

(අ) අයදුම්පත්‍ර A4 (සෙ. මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(i) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද,

(ii) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ, අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය.

(iii) ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. තවද අසම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් සැලකිලිමත් විය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කෙරේ.

ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(ආ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2013 ජූලි මස 23 වැනි දින හෝ ඊට කලින් පහත ලිපිනයට එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව" රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවා ගැනීම - 2013" යනුවෙන් සඳහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

(ඇ) දැනටමත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් අයදුම්පත්‍රයේ අංක 12.0 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

(ඈ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කල ඡායා පිටපත්ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියද ෆැක්ස් මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(ඉ) අයදුම්කරු විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර විභාග දිනයේ ශාලාධිපති වෙත ඉදිරිපත් කල යුත්තේ එසේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයයි. අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

(ඊ) කිසියම් අපේක්ෂකයෙකු වෙත විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

13. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2013 ජූනි මස.. වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම්/දිසාපති කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2013**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

අයදුම් කරන ශ්‍රේණිය :
III ශ්‍රේණිය - 1
පුහුණු ශ්‍රේණිය - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0
1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : PERERA, A. B. C.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)
1.4 ජාතික හැඳුනුම්පත් අංකය

2.0
2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.4 තැපැල් නගරය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0
3.1 ස්ත්‍රී/පුරුෂ භාවය
(ආදාළ අංකය කොටුව තුළ ලියන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1
3.2 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :
3.3 2013.07.23 දිනට වයස : අවුරුදු : මාස : දින :

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 2. | |
| 3. | | 4. | |
| 5. | | 6. | |
| 7. | | 8. | |
| 9. | | 10. | |

4.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.0 තාක්ෂණ සුදුසුකම් :

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාල සීමාව | සාමාර්ථ්‍යය | සහතික පත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |

6.0 වෙනත් සුදුසුකම් :————.

7.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වුවකු නම්,
7.1 දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ලිපිනය :————.
7.2 දැනට දරන තනතුර :————.
7.3 සේවා කාලය :————.

7.4 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන බව :——————.

8.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

(අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් ☐ නැත ☐

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

i. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :—————.
ii. ලදුපත් අංකය හා දිනය :—————.
iii. ගෙවූ මුදල :—————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

10.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

—————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිටදී ............ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

—————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය :—————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

12.0 අයදුම්කරු රජයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-

.................මයා/මිය/මෙනවියගේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
බලය පවරනු ලැබූ නිලධාරියා.

දිනය:—————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :—————.

06-438/1

---

**රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම්/දිසාපති කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා තාක්ෂණ සහායක තනතුරේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013**

1. ඉහත තනතුරුවලට බඳවාගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව, කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම්/දිසාපති කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තාක්ෂණ සහායක තනතුරේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා පත්කිරීමට තෝරාගනු ඇත.

3. *වයස් සීමාව.*— ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

4. *අධ්‍යාපන සුදුසුකම් :*
භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය, සහ විද්‍යාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වී තිබීම.

5. *වෘත්තීය සුදුසුකම් :*
ඉහත අධ්‍යාපන සුදුසුකම් සහිතව ජාතික වෘත්තීය සුදුසුකම්වල (NVQ) 05 වන මට්ටමේ රජයේ පිළිගත් තාක්ෂණ/කාර්මික

විද්‍යාලයකින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණ (සිවිල් ඉංජිනේරු) සහතිකය ලබා තිබීම.

6. *වෙනත් සුදුසුකම් :*

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු වී තිබීම.

(ආ) විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.

7. *වැටුප් පරිමාණය :*
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 යටතේ MT1- 2006A
රු. 14,425 - 10 x 145 - 11 x 170 -6 x 240 - 14 x 320 - රු. 23,665

4වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු අතර, පත්වීම ලැබ වසර 05 ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 7/2007 පරිදි අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

8. *සේවා කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

2. තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අභිමතය පරිදි දිස්ත්‍රික් ලේකම්/දිසාපති කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කරනු ඇත.

3. තෝරාගන්නා අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යටත්වනු ඇත.

4. තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වන අතර, දැනටමත් රජයේ සේවකයෙක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්වේ.

5. තෝරාගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විටින් විට රජය විසින් නිකුත් කරන නියෝග හා දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටී.

9.

(i) *බඳවා ගැනීමේ ක්‍රමය :*
මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2013 සැප්තැම්බර් මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

(ii) *විභාග ක්‍රමය :*

(අ) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයා විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

(ඇ) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

(iii) *විභාගයේ විෂයන් :*
විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.
1. බුද්ධි පරීක්ෂණය
2. තාක්ෂණික ප්‍රශ්න පත්‍රය

10. *විෂය නිර්දේශය :*
1. බුද්ධි පරීක්ෂණය :

කාලය පැය 01 කි
මුළු ලකුණු 100 යි.

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීම, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

2. තාක්ෂණික ප්‍රශ්න පත්‍රය :
කාලය පැය 03 කි
මුළු ලකුණු 100 යි.
ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීමේ කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීම, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියා මාර්ග හා අපද්‍රව්‍යය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙල පිළිබඳව අපේක්ෂකයා සතු දැනුම විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත වේ.

ඉහත එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණු ප්‍රමාණවල එකතුව අනුව බඳවා ගැනීම සඳහා වූ ප්‍රමුඛතා ලේඛනය සකස් කෙරේ.

* ඉහත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා අවශ්‍ය වන ජ්‍යාමිතික උපකරණ හා සෙසු උපාංග අයදුම්කරු විසින් විභාග ශාලාවට රැගෙන යා යුතුය.

11. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :*
ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කල හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

12. *විභාග ගාස්තු :*
විභාග ගාස්තු රු. 500 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවෙන පරිදි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසා වත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

13. *අයදුම් කළ යුතු ක්‍රමය :*
(අ) අයදුම්පත්‍ර A4 (සෙ. මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(i) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද,

(ii) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ, අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතුය.

(iii) ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් සැලකිලිමත් විය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කෙරේ. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය.

(ආ) විභාගය සඳහා වන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2013 ජූලි මස 23 වැනි දින හෝ ඊට කලින් පහත ලිපිනයට එවිය යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

ඉල්ලුම්පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ තාක්ෂණ සහායක තනතුරේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීම - 2013" යනුවෙන් සඳහන් කළ යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම ඉල්ලුම්පතක් භාරගනු නොලැබේ.

(ඇ) දැනටමත් රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන් අයදුම්පත්‍රයේ අංක 12.0 ශීර්ෂය යටතේ තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

(ඈ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, ලියා පදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ෆැක්ස් මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(ඉ) අයදුම්කරු විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර විභාග දිනයේ ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුත්තේ එසේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයයි. අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

(ඊ) කිසියම් අපේක්ෂකයෙකු වෙත විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

14. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.

2. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම ගැසට් පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2013 ජූනි මස 04 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම්/දිසාපති කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා තාක්ෂණ සහායක තනතුරේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2013

[ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2 [ ]
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.0

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) උදා : PERERA, A. B. C.

1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

2.0

2.1 ස්ථිර ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.4 තැපැල් නගරය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0

3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :
(ආදළ අංකය කොටුව තුළ ලියන්න)
පුරුෂ - 0
ස්ත්‍රී - 1 [ ]

3.2 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

3.3 2013.07.23 වැනි දිනට වයස : අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

4.0 *අධ්‍යාපන සුදුසුකම් :*

4.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 2. | |
| 3. | | 4. | |
| 5. | | 6. | |
| 7. | | 8. | |
| 9. | | 10. | |

4.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර : (සමත්ව ඇත්නම්)
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

5.0 *තාක්ෂණ සුදුසුකම් :*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාල සීමාව* | *සාමාර්ථය* | *සහතික පත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |

6.0 වෙනත් සුදුසුකම් :————.

7.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වුවකු නම්,
7.1 දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ලිපිනය :————.
7.2 දැනට දරන තනතුර :————.
7.3 සේවා කාලය :————.
7.4 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන බව :————.

8.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

(අදාල කොටුවේ √ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් [ ] නැත [ ]

9.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

10.0 *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

(ඇ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී ............ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

12.0 අයදුම්කරු රජයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-

……………..මයා/මිය/මෙනවියගේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු ලැබූ නිලධාරියා.

දිනය:————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

06-438/2

---

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය - නාරාහේන්පිට**
**2013 වසරේ දෙවන අර්ධ වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම**

*පූර්ණ කාලීන පාඨමාලා*

| | *Course* | *NVQ Level* | *Duration (Months)* | *Qualifications* | *Course Fees (Rs.)* |
|---|---|---|---|---|---|
| 1 | Computer Hardware Technician and CISCO IT Essential (A+) | IV | 6 | D | 10,000 |
| 2 | Computer Graphic Designer | IV | 6 | H | 12,000 |
| 3 | Adobe Certified Associate | Non | 6 | G | 30,000 |
| 4 | National Certificate in information Technology (NCICT) | Non | 6 | D | 6,000 |
| 5 | Free and Open Source Software (FOSS) | Non | 6 | A | 12,500 |
| 6 | Computer Application Assistant (දෘශ්‍යාබාධිත) | III | 6 | - | Free |
| 7 | Computer Graphic Designer (ශ්‍රවණාබාධිත) | IV | 6 | - | Free |
| 8 | කාර්මික කළමණාකරණ ඩිප්ලෝමාව | Non | 6 | E | 25,000 |
| 9 | රූපලාවන්‍ය ශිල්පී | IV | 6 | B | 35,000 |
| 10 | කොන්ඩා සැකසුම් ශිල්පී | IV | 6 | B | 45,000 |
| 11 | Diploma in Spa Therapy (Stage 1) | Non | 6 | F | 40,000 |
| 12 | Advanced Diploma in Cosmetology (Stage 2) | Non | 6 | F | 40,000 |
| 13 | බේකරි ශිල්පී | IV | 6 | B | 25,000 |
| 14 | සූපවේදී | IV | 6 | B | 25,000 |
| 15 | Steward/Waiter | III | 6 | B | 10,000 |
| 16 | මෝටර් රථ වායුසමීකරණ ශිල්පී | IV | 6 | B | 2,000 |
| 17 | Offset Lithograhphic Operator | II | 6 | B | 3,000 |
| 18 | CNC Programming | IV | 6 | C | 5,000 |
| 19 | උද්‍යාන අලංකරණ තාක්ෂණය | Non | 6 | B | Free |
| 20 | රියදුරු පුහුණුව (සැහැල්ලු වාහන) | Non | 3 | - | 10,000 |
| 21 | Welder | IV | 6 | M | 4,000 |

*අර්ධ කාලීන පාඨමාලා*

| *Course* | *Duration (Months)* | *Qualificatins* | *Course Fees (Rs.)* |
|---|---|---|---|
| CISCO Hardware - IT Essential (A+) | 150 | A | 12,000 |
| Cisco Networking (CCNA) | 300 | G | 40,000 |
| Adobe Certified Associate | 120 | J | 30,000 |
| Web Designing and Development | 150 | A | 10,000 |
| PC Based Application (MS Office) | 100 | B | 8,000 |
| Computer Graphic Designer (NVQ 4) | 392 | H | 17,000 |
| Auto Cad (2D) | 100 | L | 9,000 |
| Auto Cad (3D) | 70 | L | 6,500 |
| Baker | 120 | B | 20,000 |
| Quantitity Surveyor | 80 | L | 15,000 |
| Auto Mobile Technician (Engine/Petrol/Diesel) | 160 | I | 10,500 |
| Electrical (Domestic) | 100 | D | 9,000 |
| Motor Winder | 100 | B | 9,000 |
| Draftmanship (Civil/Mechanical/Electrical) | 180 | D | 12,000 |
| IC3 + International Certificate | 120 | K | 19,000 |
| CNC Programming | 125 | B | 9,000 |
| Certificate in Resturant Operation | 120 | G | 25,000 |
| ලේඛකත්වය හා ජනසන්නිවේදන පිළිබඳ පදනම් පාඨමාලාව | 150 | N | 12,000 |

පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2013.06.30 දිනට වයස අවු 16ක් 35ත් අතර ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැක. අර්ධ කාලීන පාඨමාලා සඳහා උපරිම වයස් සීමාවන් නොසැලකෙන අතර එම පාඨමාලා සෙනසුරාදා/ඉරිදා දිනයන්හි පැවැත්වේ.

**ප්‍රතිලාභ**

- * දේශීය විදේශීය රැකියා අවස්ථා
- * කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අඩු පොළී ණය පහසුකම්
- * ජාතික හා ජාත්‍යන්තර පිළිගත් (NVQ) සහතිකයක්
- * විෂය දැනුමට අමතරව ඉංග්‍රීසි දැනුම
- * දීමනා සමඟ මාස 06ක වැඩිදුර පුහුණුව

සුදුසුකම් :

A. අ. පො. ස. (සා. පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06කින් සමත් වීම.
B. අ. පො. ස. (සා/පෙළ) දක්වා හදාරා තිබීම.
C. අ. පො. ස. (සා/පෙළ) විෂයන් 06කින් සමත් වී තිබීම සහ යන්ත්‍රණය NVQ Level III පාඨමාලාවක් හදාරා තිබීම.
D. අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයන් 06කින් සමත්වීම.
E. පිළිගත් කාර්මික ආයතනයකින් මූලික පාඨමාලාව හදාරා ක්ෂේත්‍රයේ රැකියාවක නියුතු අය හෝ පිළිගත් ආයතනයක කාර්මික ක්ෂේත්‍රයේ වැඩ මූලික/වැඩ මූලික සහායක/වැඩ අධීක්ෂක රැකියාවක අවුරුදු 02ක පළපුරුද්දක් තිබීම.
F. ජාතික වෘත්තීය සුදුසුකම් III, IV Hairdresser/Beautician සහතිකය තිබීම
G. අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව සමත්වීම.
H. අ. පො. ස. (සා. පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයයන් 06කින් සමත්වීම සහ මූලික පරිඝණක පාඨමාලාවක් හදාරා තිබීම.
I. නවය වසර සමත්වීම.
J. අ. පො. ස. (සා. පෙළ) ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව සම්මාන සහිතව සමත් වී තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ නියැළී සිටීම.
K. අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි සහිතව විෂයන් 06කින් සමත්වී තිබීම.
L. මූලික සැලසුම් ශිල්පී පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාළ ක්ෂේත්‍රයේ නියැලී සිටීම.
M. පැස්සුම් පාඨමාලාවක් හදාරා තිබීම.
N. අ. පො. ස. (සා. පෙළ) සිංහල සම්මාන සහිතව විෂයයන් 06කින් සමත්වී තිබීම.

තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් 2012.07.02 දිනට පෙර තමාගේ ලිපිනය ලියන ලද මුද්දර කවරයක් සමඟ පහත ලිපිනයට එවන්න.

සහකාර අධ්‍යක්ෂ.
ජාතික වෘත්තීය පුහුණු ආයතනය,
අංක 354, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට.

දුරකථනය අංක : 011-72771111 (IT Center)/011-2592233
ඊ-මේල් : nvtinarahenpita@vtasl.gov.lk

06-358

**යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**2013 දෙවැනි අර්ධ වර්ෂය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම**

දිවයින පුරා පිහිටි වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා වයස අවුරුදු 16 - 35 අතර ශ්‍රී ලාංකික තරුණ, තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය ඃ- 2013.07.10

සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය.

04 වැනි මහල,
නිපුණතා පියස
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

දුරකථන අංක - 011-7277888,
011-7270270.

පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම් ඃ

අ. පො. ස. (සා. පෙළ) පෙනී සිටීම—

* විදුලි ශිල්පී - ජාතික සහතිකය (මාස 12)
* ගෘහ විදුලි උපකරණ අලුත්වැඩියා කරන්නා - ජාතික සහතිකය (මාස 12)
* විදුලි මෝටර් එතුම් ශිල්පී - ජාතික සහතිකය (මාස 12)
* සූපවේදී - ජාතික සහතිකය (මාස 12)
* ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික - ජාතික සහතිකය (මාස 12)

අ. පො. ස. (සා. පෙළ) විෂයයන් 06කින් සමත් වීම—

* පරිගණක දෘඩාංග ශිල්පී - ජාතික සහතිකය (මාස 12)
* මෝටර් කාර්මික - ජාතික සහතිකය (මාස 12)/මෝටර් රථ විදුලි කාර්මික ජාතික සහතිකය (මාස 12)/මෝටර් රථ වායු සමීකරණ ශිල්පී - ජාතික සහතිකය (මාස 12)
* ග්‍රැෆික් නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය (මාස 12)
* මෝස්තර නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය (මාස 12)
* ඇඟලුම් තත්ව පාලක

අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි, ගණිතය ඇතුළු විෂයයන් 06කින් සමත්වීම—

* තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී
* ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහතික පත්‍ර පාඨමාලාව (NCICT)
* ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (NDICT) (තොරතුරු තාක්‍ෂණය පිළිබඳ මූලික පාඨමාලාවක් හදාරා තිබීම)

අ. පො. ස. (සා. පෙළ) ඉංග්‍රීසි සම්මාන සහිතව විෂයයන් 06කින් සමත්වීම—

* ලේකම් පරිචය (මාස 15)
* පරිගණක ජාල පාඨමාලාව - CISCO (පැය 300)

අ. පො. ස. (සා. පෙළ) සමත්වීම හා අ. පො. ස. (උ. පෙළ) ට පෙනී සිටීම—

* ප්‍රමාණ සමීක්‍ෂණ සහතික පත්‍ර පාඨමාලාව - අ. පො. ස. (උ/පෙළ) ගණිතය ඇතුළුව විෂයයන් 02කින් සමත්වීම (මාස 12)
* සැලසුම් ශිල්පී - අ. පො. ස. (උ/පෙළ) විෂයයන් 03කින් සමත්වීම. (මාස 12)

පහත පාඨමාලා සඳහා 09 වසර සමත්වීම—

* ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු) - ජාතික සහතිකය (මාස 12)
* රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය (මාස 09 හා මාස 06)
* ජලනල කාර්මික - ජාතික සහතිකය (මාස 12)
* කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය (මාස 09 හා මාස 06)
* රියැදුරු (සැහැල්ලු) අවු. 18ට වැඩි
* අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය (මාස 12)
* මෝටර් රථ වැද්දුම් ශිල්පී
* අධිවේගී මහන යන්ත්‍ර කාර්මික - ජාතික සහතිකය (මාස 12)
* මෝටර් රථ පින්තාරු ශිල්පී - ජාතික සහතිකය (මාස 12)
* ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) - ජාතික සහතිකය (මාස 12)
* යතුරුපැදි කාර්මික ශිල්පී - ජාතික සහතිකය (මාස 12)
* තිර මුද්‍රණකරු (මාස 12)
* කෘෂි උපකරණ කාර්මික - ජාතික සහතිකය (මාස 12)
  (මාස 12 සඳහා අ. පො. ස. (සා/පෙළ) විෂයයන් 03කින් සමත්වීම)
* ඇඳුම් මැසීම (පිරිමි)
* ත්‍රිරෝද රථ කාර්මික ශිල්පී - ජාතික සහතිකය (මාස 12)
* ස්වර්ණාභරණ අත් නිමැවුම් - ජාතික සහතිකය (මාස 12)
* බේකරි ශිල්පී - ජාතික සහතිකය (මාස 12)
* ස්වර්ණාභරණ ගල් අල්ලන්නා - ජාතික සහතිකය (මාස 12)
* එළවළු හා පළතුරු වගාකරු (මාස 12)
* මැණික් කැපුම් ශිල්පී (මාස 12)
* ලී කැටයම් ශිල්පී (මාස 12)
* ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) (මාස 06)
* තවාන් පාලනය හා පැල බද්ධකරු
* පැස්සුම් ශිල්පී (මාස 06)
* මල් හා විසිතුරු පැළ වගාකරු
* උද්‍යාන අලංකරණ ශිල්පී
* රියැදුරු (බර වාහන) - අවු. 21 ට වැඩි වීම, සැහැල්ලු වාහන රියැදුරු බලපත්‍රය ලබා වසර 03ක් ගතවී තිබීම.

අයදුම්පත් 2013.07.10 වැනි දිනට පෙර තෝරාගත් දිස්ත්‍රික්කවල සහකාර අධ්‍යක්ෂ නමට යොමු කරන්න.

***ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ***

පුහුණුව සමඟ ඔබට

* නිපුණතා පාදක පුහුණුව (CBT) යටතේ පාඨමාලා හැදෑරීම
* ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) මට්ටම 03 හා 04 ලබා ගැනීමෙන් පසු ඩිප්ලෝමා හා තාක්‍ෂණ උපාධිය ලබා ගැනීමේ අවස්ථාව
* විශේෂ වූ පාඨමාලා කිහිපයක් සඳහා මාසික දීමනා
* තෝරාගත් පාඨමාලා සඳහා සහනදායී මුදලකට ලංගම වාර ප්‍රවේශ පත්‍ර
* වෘත්තීය උපදේශන සේවාව හා වෘත්තීය ඉංග්‍රීසි දැනුම
* ව්‍යවසායකත්ව දැනුම
* ශිල්පීය ප්‍රවර්ධන දැනුම

පුහුණුවෙන් පසු ඔබට

* දීමනාවක් සමගින් වැඩිදුර පුහුණුව
* රජයේ පිළිගත් සහතිකයක්
* විදේශීය රැකියා සඳහා යොමු කිරීම
* ස්වයං රැකියා සඳහා යොමු කිරීම
* කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමට අවශ්‍ය ව්‍යවසායකත්ව පුහුණුව සමඟ ණය පහසුකම් සඳහා යොමු කිරීම
* ව්‍යාපාර උපදේශන සේවා
* ක්ෂේත්‍රයේ නියලෙන්නන්ගේ නිපුණතාවය වර්ධනය කිරීමේ වැඩමුළු
* වෘත්තීය අධ්‍යාපනය තුළින් කාර්මික ක්ෂේත්‍රයේ උපාධියක්

**අම්පාර දිස්ත්‍රික්කය - දුරකථන අංකය - 067 -2251155**

| අංකය | පාඨමාලාව | NVQ / Non NVQ | පුහුණුව මාස (වැඩිදුර පුහුණුව ඇතුළත්ව) | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | පාඨමාලා ගාස්තු රු. |
|---|---|---|---|---|---|
| 01 | විදුලි ශිල්පී (ගෘහස්ථ) -ජාතික සහතිකය | NVQ III | 12 | පොතුවිල් | |
| | | | | සෙන්ට්‍රල් කැම්ප් | |
| | | | | සයින්දමරු | |
| | | | | අක්කරෙයිපත්තු | නොමිලේ |
| | | | | මහඔය (සිංහල මාධ්‍ය) | |
| | | | | දමන (හිඟුරාන) | |
| 02 | ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)- | NVQ III | 12 | | |
| | ජාතික සහතිකය | | | සෙන්ට්‍රල් කැම්ප් | |
| | | | | මහාඔය | නොමිලේ |
| | | | | කාර්තිව් | |
| | | | | දමන (හිඟුරාන) | |
| 03 | ජල නල කාර්මික- ජාතික සහතිකය | NVQ III | 12 | කාර්තිව් | |
| | | | | සෙන්ට්‍රල් කැම්ප් | නොමිලේ |
| | | | | කල්මුණේ | |
| 04 | ජාතික තොරතුරු හා සන්නිවේදන | | | | |
| | තාක්‍ෂණ සහතික පත්‍ර පාඨමාලාව (NCICT) | Non NVQ | 12 | සමන්තුරේ | |
| | | | | අම්පාර | 6,000/- |
| | | | | කාර්තිව් | |
| | | | | සයිදුමරුදු | |
| 05 | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ | NVQ IV | 12 | ඉන්ද්‍රසාර පිරිවෙන | |
| | ශිල්පී - ජාතික සහතිකය | | | පොතුවිල් | |
| | | | | දෙහිඅත්ත කන්ඩිය | 6,000/- |
| | | | | සෙන්ට්‍රල් කැම්ප් | |
| | | | | අක්කරෙයිපත්තු | |
| 06 | ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) - | | | | |
| | ජාතික සහතිකය | NVQ IV | 12 | උගන | |
| | | | | සෙන්ට්‍රල් කැම්ප් | 1,000/- |
| | | | | දෙහිඅත්ත කණ්ඩිය | |
| | | | | නින්දවූර් දි.වෘ.පු.ම. | |
| 07 | ඇඳුම් මැසීම ( පිරිමි) - ජාතික සහතිකය | NVQ III | 12 | දමන (හිඟුරාන) | 500/- |
| 08 | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු- | | | | |
| | ජාතික සහතිකය | NVQ III | 06 | සමන්තුරේ | නොමිලේ |
| 09 | රියැදුරු (බර වාහන) | Non NVQ | 03 | නින්දවූර් දි.වෘ.පු.ම. | 8,000/- |
| 10 | රියැදුරු (සැහැල්ලු වාහන ) | Non NVQ | 03 | නින්දවූර් දි.වෘ.පු.ම. | 10,000/- |
| 11 | ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික- | | | | |
| | ජාතික සහතිකය | NVQ III | 12 | කාර්තිව් | 1,500/- |
| 12 | ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) | | | | |
| | - ජාතික සහතිකය | NVQ III | 12 | අලයඩිවෙම්බු | |
| | | | | පොතුවිල් | |
| | | | | ඉරගම | නොමිලේ |
| | | | | මහඔය | |
| | | | | උගන | |
| 13 | රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 09 | අම්පාර | 6,000/- |
| 14 | කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 09 | අම්පාර | 9,000/- |
| 15 | විදුලි මෝටර් එතුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | අක්කරෙයිපත්තු | |
| | | NVQ III | 12 | දෙහිඅත්තකණ්ඩිය | නොමිලේ |
| | | | | (සිංහල මාධ්‍ය) | |
| | | | | සමන්තුරේ | |
| 16 | පැස්සුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | සෙන්ට්‍රල් කැම්ප් | නොමිලේ |
| 17 | ත්‍රිරොද රථ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | සෙන්ට්‍රල් කැම්ප් | |
| | | | | සමන්තුරේ | 500/- |
| 18 | සූපවේදී- ජාතික සහතිකය | NVQ III | 12 | පොතුවිල් | 2,000/- |
| 19 | භෝජනාගාර සේවක- ජාතික සහතිකය | NVQ IV | 12 | පොතුවිල් | 4,000/- |

| අංකය | පාඨමාලාව | NVQ / Non NVQ | පුහුණුව මාස (වැඩිදුර පුහුණුව ඇතුළත්ව) | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | පාඨමාලා ගාස්තු රු. |
|---|---|---|---|---|---|
| 20 | කාමර සේවක- ජාතික සහතිකය | NVQ III | 12 | පොතුවිල් | 3,000/- |
| 21 | බේකරි ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | සමන්තුරේ | 2,500/- |
| 22 | ඇඟලුම් තත්ව පාලක | NVQ III | 12 | සමන්තුරේ<br>අම්පාර | නොමිලේ |
| 23 | ලී කැටයම් ශිල්පී | Non NVQ | 12 | අක්කරෙයිපත්තු | නොමිලේ |

අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය : සහකාර අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය ,
මහවීදිය, නින්දවූර්, අම්පාර.

දුරකථන අංක 067- 2250196 / 067-2251155.

**අනුරාධපුර දිස්ත්‍රික්කය - දුරකථන අංකය - 025 - 2221400**

| අංකය | පාඨමාලාව | NVQ / Non NVQ | පුහුණුව මාස | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | පාඨමාලා ගාස්තු රු. |
|---|---|---|---|---|---|
| 01 | විදුලි ශිල්පී (ගෘහස්ථ)- ජාතික සහතිකය | NVQ III | 12 | පලුගස්වැව | නොමිලේ |
| 02 | ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහතිකපත්‍ර පාඨමාලාව (NCICT) | Non NVQ | 12 | බුල්නෑව | 6,000/- |
| 03 | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | තඹුත්තේගම<br>මිහින්තලේ | 6,000/- |
| 04 | පරිගණක දෘඩාංග ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | තිරිප්පනේ<br>මිහින්තලේ | 6,000/- |
| 05 | රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 09 | දි.වෘ.පු.ම.අනුරාධපුර | 6,000/- |
| | | NVQ III | 06 | බුල්නෑව | 2,000/- |
| 06 | කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 09 | දි.වෘ.පු.ම.අනුරාධපුර | 9,000/- |
| | | NVQ III | 06 | බුල්නෑව | 3,000/- |
| 07 | රියැදුරු (බර වාහන) | Non NVQ | 06 | දි.වෘ.පු.ම.අනුරාධපුර | 8,000/- |
| 08 | රියැදුරු (සැහැල්ලු වාහන) | Non NVQ | 06 | දි.වෘ.පු.ම.අනුරාධපුර | 10,000/- |
| 09 | තිර මුද්‍රණකරු | Non NVQ | 12 | තඹුත්තේගම | නොමිලේ |
| 10 | ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) - ජාතික සහතිකය | NVQ IV | 12 | මිහින්තලේ<br>තඹුත්තේගම<br>ආඬියාගල | 1,000/- |
| 11 | ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු) - ජාතික සහතිකය | NVQ III | 12 | වැලිඔය<br>ගල්කිරියාගම | නොමිලේ |
| 12 | ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික - ජාතික සහතිකය | NVQ III | 12 | පළුගස්වැව | 1,500/- |
| 13 | ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) - ජාතික සහතිකය | NVQ III | 12 | ගෝනපතිරාව<br>ආඬියාගල<br>ගල්කිරියාගම | නොමිලේ |

| අංකය | පාඨමාලාව | NVQ / Non NVQ | පුහුණුව මාස (වැඩිදුර පුහුණුව ඇතුළත්ව) | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | පාඨමාලා ගාස්තු රු. |
|---|---|---|---|---|---|
| 14 | භෝජනාගාර සේවක- ජාතික සහතිකය | NVQ IV | 12 | දි.වෘ.පු.ම.අනුරාධපුර | 4,000 |
| 15 | මෝටර් රථ වායු සමීකරණ ශිල්පී- ජාතික සහතිකය | NVQ III | 12 | බුල්නෑව | 2,000 |
| 16 | සූපවේදී - ජාතික සහතිකය | NVQ IV | 12 | දි.වෘ.පු.ම.අනුරාධපුර | 5,000 |
| 17 | මෝටර් රථ වැද්දුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | බුල්නෑව | නොමිලේ |
| 18 | බේකරි ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | දි.වෘ.පු.ම.අනුරාධපුර | 5,000 |
| 19 | ත්‍රිරෝද රථ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | මැදවච්චිය | 500 |
| | | NVQ IV | 12 | මිහින්තලේ | |
| 20 | කාමර සේවක- ජාතික සහතිකය | NVQ III | 12 | දි.වෘ.පු.ම.අනුරාධපුර | 3,000 |

අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය : සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය,
නුවර වැව පාර,අනුරාධපුරය.
දුරකථන අංක : 025-2221400

**බදුල්ල දිස්ත්‍රික්කය - දුරකථන අංකය - 057 - 2223043**

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | ඇලුමිණියම් පිරිසැකසුම් කාර්මික - ජාතික සහතිකය | NVQ III | 12 | දි.වෘ.පු.ම. රොක්හිල් - බදුල්ල | 1,500 |
| 02 | රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 9 | බණ්ඩාරවෙල | 6,000 |
| | | NVQ III | 6 | දි.වෘ.පු.ම. රොක්හිල් - බදුල්ල | 2,000 |
| 03 | කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 9 | බණ්ඩාරවෙල | 9,000 |
| | | NVQ III | 6 | දි.වෘ.පු.ම. රොක්හිල් - බදුල්ල | 3,000 |
| 04 | ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) - ජාතික සහතිකය | NVQ III | 12 | පස්සර<br>සොරණාතොට<br>ගිරාඳුරුකෝට්ටේ | නොමිලේ |
| 05 | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | දි.වෘ.පු.ම. රොක්හිල් - බදුල්ල<br>සොරණාතොට<br>හල්දුම්මුල්ල | 6,000 |
| 06 | පරිගණක දෘඩාංග ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | දි.වෘ.පු.ම.රොක්හිල් - බදුල්ල<br>දිවිතොටවෙල | 6,000 |
| 07 | විදුලි ශිල්පී (ගෘහස්ථ) - ජාතික සහතිකය | NVQ III | 12 | දිවිතොටවෙල<br>හල්දුම්මුල්ල<br>පස්සර | නොමිලේ |
| 08 | විදුලි මෝටර් එතුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | දිවිතොටවෙල | නොමිලේ |
| 09 | පෑස්සුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | හල්දුම්මුල්ල<br>ගිරාඳුරුකෝට්ටේ | නොමිලේ |
| 11 | ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) - ජාතික සහතිකය | NVQ III | 12 | සොරණාතොට<br>පස්සර<br>ගිරාඳුරුකෝට්ටේ | 1,000 |
| 12 | ඇඟලුම් තත්ත්ව පාලක - ජාතික සහතිකය | NVQ III | 12 | බණ්ඩාරවෙල | නොමිලේ |
| 13 | ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු)- ජාතික සහතිකය | NVQ III | 12 | බණ්ඩාරවෙල | නොමිලේ |
| 14 | ලෝහ පිරිසැකසුම්- ජාතික සහතිකය | NVQ III | 24 | බණ්ඩාරවෙල | නොමිලේ |
| 15 | ලේකම් පරිචය | Non NVQ | 15 | බණ්ඩාරවෙල | 4,000 |
| 16 | බේකරි ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | බණ්ඩාරවෙල | 2,500 |
| 17 | මෝටර් රථ විදුලි කාර්මික - ජාතික සහතිකය | NVQ III | 24 | මාපාකඩවැව | 3,000 |
| 18 | ත්‍රිරෝදරථ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | බණ්ඩාරවෙල<br>මාපාකඩවැව | 500 |
| 19 | සූපවේදී- ජාතික සහතිකය | NVQ III | 12 | බණ්ඩාරවෙල | 2,000 |
| 20 | ජලනල කාර්මික - ජාතික සහතිකය | NVQ III | 12 | දි.වෘ.පු.ම. රොක්හිල් - බදුල්ල | නොමිලේ |

අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය : සහකාර අධ්‍යක්‍ෂ, දිස්ත්‍රික් කාර්යාලය ,
අඹේගොඩ, බණ්ඩාරවෙල,
දුරකථනය අංකය :- 057-2223043

**කොළඹ දිස්ත්‍රික්කය - දුරකථන අංකය - 011 - 2844151**

| අංකය | පාඨමාලාව | NVQ / Non NVQ | පුහුණුව මාස (වැඩිදුර පුහුණුව ඇතුළත්ව) | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | පාඨමාලා ගාස්තු රු. |
|---|---|---|---|---|---|
| 01 | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | පන්නිපිටිය<br>හොන්නන්තර<br>මහරගම<br>වැල්ලවත්ත(ලක්විරු සෙවන)<br>කෝට්ටේ (නිපෝන්)<br>දි.වෘ.පු.ම. රාජගිරිය | 6,000 |
| 02 | ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහතිකපත්‍ර පාඨමාලාව(NCICT) | Non NVQ | 12 | පාදුක්ක | 6,000 |
| 03 | පරිගණක දෘඩාංග ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | මාලඹේ | 6,000 |
| 04 | ග්‍රැෆික් නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | මහරගම | 8,000 |
| 05 | ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) - ජාතික සහතිකය | NVQ IV | 12 | මහරගම<br>හෝමාගම | 1,000 |
| 06 | ඇඳුම් මැසීම (පිරිමි)- ජාතික සහතිකය | NVQ III | 12 | පාදුක්ක | 500 |
| 07 | ඇගලුම් තත්ත්ව පාලක - ජාතික සහතිකය | NVQ III | 12 | දෙහිවල(කළුබෝවිල) | නොමිලේ |
| 08 | ඇලුමිනියම් පිරිසැකසුම් කාර්මික - ජාතික සහතිකය | NVQ IV | 12 | හෝමාගම | 1,500 |
| 09 | පැස්සුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | එළමලවල | නොමිලේ |
| 10 | රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 09 | පන්නිපිටිය<br>දෙහිවල( කළුබෝවිල)<br>දි.වෘ.පු.ම. රාජගිරිය | 6,000 |
| 11 | කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 09 | පන්නිපිටිය<br>දෙහිවල<br>දි.වෘ.පු.ම. රාජගිරිය | 9,000 |
| 12 | බේකරි ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | පාදුක්ක | 2,500 |
| 13 | විදුලි ශිල්පී (ගෘහස්ථ) - ජාතික සහතිකය | NVQ III | 12 | වැල්ලවත්ත(ලක්විරුසෙවන)<br>පාදුක්ක<br>හොන්නන්තර | නොමිලේ |
| 14 | ස්වර්ණාභරණ ගල් අල්ලන්නා - ජාතික සහතිකය | NVQ III | 12 | දි.වෘ.පු.ම. රාජගිරිය | 2,000 |
| 15 | ජලනල කාර්මික - ජාතික සහතිකය | NVQ III | 12 | එළමලවල<br>සීතාවක | නොමිලේ |
| 16 | උද්‍යාන අලංකරණ ශිල්පී | Non NVQ | 12 | මාලබේ | නොමිලේ |
| 17 | සූපවේදී- ජාතික සහතිකය | NVQ III | 12 | හොන්නන්තර<br>වැල්ලවත්ත(ලක්විරුසෙවන)<br>දි.වෘ.පු.ම. රාජගිරිය | 2,000 |
| 18 | අධිවේගී මහනයන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | NVQ III | 06 | මාලබේ<br>සීතාවක<br>මහරගම | නොමිලේ |
| 19 | මෝටර් රථ වායු සමීකරණ ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | දි.වෘ.පු.ම. රාජගිරිය | 2,000 |
| 20 | මොටර් රථ පින්තාරු ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | එළමළවල | 1,500 |
| 21 | ඉදිකිරීම් තාක්‍ෂණය (පෙදරේරු)- ජාතික සහතිකය | NVQ III | 12 | සීතාවක | නොමිලේ |
| 22 | ත්‍රිරෝදරථ කාර්මික ශිල්පී- ජාතික සහතිකය | NVQ III | 12 | ගොතටුව<br>එළමළවල | 500 |

*අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය :* සහකාර අධ්‍යක්‍ෂ,
දිස්ත්‍රික් කාර්යාලය,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
මහාමේඝ පෙදෙස, මහරගම
දුරකථන අංකය :- 011-2844151

**ගාල්ල දිස්ත්‍රික්කය - දුරකථන අංකය - 091 - 2234540**

| *අංකය* | *පාඨමාලාව* | *NVQ / Non NVQ* | *පුහුණුව මාස (වැඩිදුර පුහුණුව ඇතුළත්ව)* | *වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය* | *පාඨමාලා ගාස්තු රු.* |
|---|---|---|---|---|---|
| 1. | ජල නල කාර්මික- ජාතික සහතිකය | NVQ III | 12 | නාරිගම - හික්කඩුව<br>DVTC ඇල්පිටිය | නොමිලේ |
| 2 | යතුරුපැදි කාර්මික ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | ඌරවත්ත | 500 |
| 3. | ත්‍රිරෝදරථ කාර්මික ශිල්පී- ජාතික සහතිකය | NVQ III | 12 | ගිනිමැල්ලගහ<br>තවලම | 500 |
| 4 | විදුලි ශිල්පී (ගෘහස්ථ) - ජාතික සහතිකය | NVQ III | 12 | යක්කලමුල්ල<br>තවලම | නොමිලේ |
| 5 | විදුලි මෝටර් එතුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | ඉමදූව | නොමිලේ |
| 6 | පරිගණක දෘඩාංග ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | තවලම | 6,000 |
| 7. | CISCO පරිගණක ජාල පාඨමාලාව (CCNA) | Non NVQ | 300 hour | වැල්බට් ටවුම | 40,000 |
| 8 | පරිගණක දෘඩාංග ශිල්පී<br>- ජාතික සහතිකය (A+)- ජාතික සහතිකය | NVQ IV | 12 | වැල්බට් ටවුම | 10,000 |
| 9. | ග්‍රැෆික් නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | වැල්බට් ටවුම | 8,000 |
| 10. | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ශිල්පී<br>- ජාතික සහතිකය | NVQ IV | 12 | ඌරගහ<br>ඇඹලෙගෙදර<br>නාරිගම-හික්කඩුව | 6,000 |
| 11. | ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහතිකපත්‍ර පාඨමාලාව (NCICT) | Non NVQ | 12 | යක්කලමුල්ල<br>DVTC ඇල්පිටිය<br>ඉමදූව<br>තවලම<br>ඌරවත්ත | 6,000 |
| 12. | උද්‍යාන අලංකරණ ශිල්පී | Non NVQ | 12 | DVTC ඇල්පිටිය<br>හික්කඩුව | නොමිලේ |
| 13. | අධිවේගී මහන යන්ත්‍ර කාර්මික<br>- ජාතික සහතිකය | NVQ IV | 12 | කොග්ගල | නොමිලේ |
| 14. | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු<br>- ජාතික සහතිකය | NVQ III | 09 | කොග්ගල | නොමිලේ |
| 15. | ඇඟළුම් නිෂ්පාදන සුපරීක්‍ෂක<br>- ජාතික සහතිකය | NVQ IV | 12 | කොග්ගල | 5,000 |
| 16. | මෝස්තර නිර්මාණ ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | කොග්ගල | 1,000 |
| 17. | ඇඟළුම් තත්ව පාලක- ජාතික සහතිකය | NVQ IV | 12 | කොග්ගල | 2,500 |
| | | NVQ III | 12 | ඉමදූව | නොමිලේ |
| 18. | ඇළුමිනියම් පිරිසැකසුම් කාර්මික<br>- ජාතික සහතිකය | NVQ III | 12 | තවලම<br>DVTC ඇල්පිටිය | 1,500 |
| 19. | සූපවේදි- ජාතික සහතිකය | NVQ IV | 12 | අහංගම<br>හික්කඩුව | 5,000 |
| 20. | බේකරි ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | අහංගම | 5,000 |
| 21. | පළතුරු හා එළවළු නිෂ්පාදන සැකසුම්කරු<br>- ජාතික සහතිකය | NVQ III | 12 | යක්කල මුල්ල | නොමිලේ |
| 22. | රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 06 | ඌරවත්ත<br>ඌරගහ<br>වැකුණුගොඩ | 2,000 |
| | | NVQ IV | 09 | වැල්බට් ටවුම | 6,000 |
| 23. | කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 06 | ඌරවත්ත<br>වැකුණුගොඩ<br>ඌරගහ | 3,000 |
| | | NVQ IV | 09 | වැල්බට් ටවුම | 9,000 |

| අංකය | පාඨමාලාව | NVQ / Non NVQ | පුහුණුව මාස (වැඩිදුර පුහුණුව ඇතුළත්ව) | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | පාඨමාලා ගාස්තු රු. |
|---|---|---|---|---|---|
| 24. | ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) - ජාතික සහතිකය | NVQ IV | 12 | ඇඹලෙගෙදර<br>ඉමදූව<br>තවලම<br>ගිනිමල්ගහ<br>හික්කඩුව<br>යක්කල මුල්ල | 1,000 |
| 25. | රියැදුරු (සැහැල්ලු වාහන) | Non NVQ | 03 | කොග්ගල | 10,000/- |
| 26. | රියැදුරු (බර වාහන) | Non NVQ | 03 | කොග්ගල | 8,000/- |
| 27. | කාමර සේවක - ජාතික සහතිකය | NVQ III | 12 | අහංගම<br>හික්කඩුව | 3,000/- |
| 28. | භෝජනාගාර සේවක- ජාතික සහතිකය | NVQ IV | 12 | අහංගම<br>හික්කඩුව | 4,000/- |
| 29. | පැස්සුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ II | 12 | ඉමදූව | නොමිලේ |
| 30. | තිර මුද්‍රණකරු | Non NVQ | 12 | මුද්‍රණ පාසල-ගාල්ල | නොමිලේ |

*අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය :* සහකාර අධ්‍යක්‍ෂ, දිස්ත්‍රික් කාර්යාලය,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ටැල්බට් ටවුම,ගාල්ල
දුරකථන :- 091-2234540

**ගම්පහ දිස්ත්‍රික්කය - දුරකථන අංකය - 033 - 2294790**

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | ත්‍රිරෝද රථ කාර්මික ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | දිවුලපිටිය | 500/- |
| 02 | යතුරුපැදි කාර්මික ශිල්පී - ජාතික සහතිකය | NVQ III | 12 | හේමානන්ද - හුණුපිටිය | 500/- |
| 03 | අධිවේගී මහන යන්ත්‍ර ක්‍රියාකරු - ජාතික සහතිකය | NVQ III | 06 | කඳාන<br>කටාන | නොමිලේ |
| 04 | රූපලාවන්‍ය ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 09 | වත්තල (Lions Club)<br>කටාන<br>නෙසෙක් (කඩවත)<br>දි.වෘ.පු.ම.ගම්පහ | 6,000/- |
| 05 | කොණ්ඩා සැකසුම් ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 09 | වත්තල (Lions Club)<br>කටාන<br>නෙසෙක් (කඩවත)<br>දි.වෘ.පු.ම.ගම්පහ | 9,000/- |
| 06 | රියැදුරු (බරවාහන) | Non NVQ | 03 | දි.වෘ.පු.ම.ගම්පහ | 8,000/- |
| 07 | රියැදුරු (සැහැල්ලු වාහන) | Non NVQ | 03 | දි.වෘ.පු.ම.ගම්පහ | 10,000/- |
| 08 | ඇඳුම් මැසීම (කාන්තා හා ළමා) - ජාතික සහතිකය | NVQ III | 12 | පෙරියමුල්ල | 1,000/- |
| 09 | විදුලි ශිල්පී (ගෘහස්ථ) - ජාතික සහතිකය | NVQ III | 12 | මේධානන්ද<br>වත්තල (ප්ලෑෂ්) | නොමිලේ |
| 10 | විදුලි ශිල්පී (කර්මාන්ත) - ජාතික සහතිකය | NVQ III | 24 | නෙසෙක් (කඩවත) | 2,000/- |
| 11 | ඇඳුම් මැසීම (පිරිමි)- ජාතික සහතිකය | NVQ III | 12 | හේමානන්ද - හුණුපිටිය | 500/- |
| 12 | අධිවේගී මහන යන්ත්‍ර කාර්මික- ජාතික සහතිකය | NVQ IV | 12 | හේමානන්ද - හුණුපිටිය | නොමිලේ |
| 13 | විදුලි මෝටර් එතුම් ශිල්පී- ජාතික සහතිකය | NVQ III | 12 | මේධානන්ද | නොමිලේ |
| 14 | සූපවේදී - ජාතික සහතිකය | NVQ III | 12 | නෙසෙක් (කඩවත)<br>පහලගම | 2,000/- |
| 15 | බේකරි ශිල්පී- ජාතික සහතිකය | NVQ IV | 12 | දි.වෘ.පු.ම.ගම්පහ | 5,000/- |
| 16 | මෝටර් කාර්මික- ජාතික සහතිකය | NVQ III | 24 | පන්සිල්ගොඩ | 2,000/- |

| අංකය | පාඨමාලාව | NVQ / Non NVQ | පුහුණුව මාස (වැඩිදුර පුහුණුව ඇතුළත්ව) | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | පාඨමාලා ගාස්තු රු. |
|---|---|---|---|---|---|
| 17 | ලී වැඩ කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) - ජාතික සහතිකය | NVQ III | 12 | දිවුලපිටිය<br>ඌරාපොල | නොමිලේ |
| 18 | මෝටර් රථ විදුලි කාර්මික - ජාතික සහතිකය | NVQ III | 24 | පන්සිල්ගොඩ | 3,000/- |
| 19 | උද්‍යාන අලංකරණ ශිල්පී | Non NVQ | 12 | නෙසෙක් (කඩවත) | නොමිලේ |
| 20 | පරිගණක දෘඩාංග ශිල්පී - ජාතික සහතිකය | NVQ IV | 12 | නෙසෙක් (කඩවත) | 6,000/- |
